# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
# MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: TO/CFM/01/05/05
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.02.16

සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත,

**2024 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම**

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් මුදල් කොමිෂන් සභාවේ ලේකම් ඇමතූ අංක BD/GN/130/12/2023 හා 2024.01.10 දිනැති ලිපිය හා 2023.12.29 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 05/2023 හි අංක 4 ඡේදය ප්‍රකාරව, 2024 අයවැය යෝජනා මගින් පළාත් සභා වෙනම වියදම් ඒකක ලෙස හඳුනා ගෙන පළාත් ප්‍රධාන ලේකම්වරු, අයවැය කටයුතු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිවයුතු වන පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් ලෙස පත්කර ඇත.

02. ඒ අනුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ඉහත අයවැය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන් අක්මුදල් නිකුත් කිරීමේ හා ඊට අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් පහත උපදෙස් නිකුත් කරනු ලබන අතර, ඒ අනුව අදාල ගිණුම් / වාර්තා පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වේ.

I. රා.මු.ච 02/2020 හි 05.2 ඡේදය අනුව භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 04 පරිදි, අදාල මුදල් වර්ෂයේ අග්‍රිම සීමාව නියම කිරීම සඳහා මුදල් වර්ෂයේ අයවැය ඇස්තමේන්තු යටතේ ඔබ වෙත සලසා ඇති මූල්‍ය ප්‍රතිපාදන පදනම් කර ගෙන මු.රෙ. 367 (අ) අනුව වාර්ෂික අක්මුදල් සීමාව තීරණය කිරීම සඳහා TOD/IMP/1, TOD/IMP/2, TOD/IMP/3 සහ TOD/IMP/9 යන ආකෘති සකස් කර අදාල විස්තර ද සමඟ මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුවේ.

II. වාර්ෂික අයවැය ඇස්තමේන්තු යටතේ අනුමත අයවැය ප්‍රතිපාදන පදනම්ව අදාල අක්මුදල් නිකුත් කිරීම සඳහා සෑම පළාත් සභාවක් විසින්ම අග්‍රිම ගිණුම් අංකයක් ලබා ගත යුතු අතර ඒ සඳහා අවශ්‍ය අයදුම්පත් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ඉදිරිපත් කල යුතුය.

III. විවෘත කරන ලද අග්‍රිම ගිණුම් අංකය යටතේ භාණ්ඩාගාර තේවල ගිණුම් පද්ධතිය (TSA) මගින් අක්මුදල් නිදහස් කිරීම සිදු කරන බැවින් ඒ සඳහා ලංකා බැංකුව / මහජන බැංකුව යටතේ නව නිල බැංකු ගිණුමක් ඒ ඒ පළාත් සභාව විසින් විවෘත කළ යුතු අතර, රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි 06 ඡේදයේ විධි විධාන යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 05 හි දක්වා ඇති උපදෙස් පරිදි ක්‍රියා කළ යුතුය.

IV. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම් මත පවතින ද්‍රවශීලතාවය මත පදනම්ව අවශ්‍ය අක්මුදල් ඔබ පළාත් සභාව වෙත නිදහස් කිරීමට කටයුතු කරනු ලබන අතර, රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි විධි විධාන යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 04 පරිදි මාසික අක්මුදල්

අවශ්‍යතාවය (TOD/IMP/4) හා අනැති බිල්පත් වාර්තාව (TOD/IMP/10) ආකෘතිපත්‍ර ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

V. රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි 08 ඡේදයේ විධි විධාන යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 06 හි දක්වා ඇති උපදෙස් පරිදි වර්ෂය අවසානයේදී මුදල් පොත පියවා අග්‍රිම ගිණුම පියවීම සඳහා දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂයක් පවතී නම් නියමිත ආකෘතිපත්‍ර (TOD/IMP/6) ප්‍රකාරව දැනුම්දෙනු ලබන නියමිත දිනට හෝ එදිනට පෙර නිල බැංකු ගිණුම් පවත්වා ගෙන යනු ලබන බැංකු ශාඛාවට භාරදිය යුතු අතර, අංක TOD/IMP/6 දරන ආකෘති පත්‍රය බැංකු භර නිවේදනයේ පිටපතක් සමඟ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කළ යුතුය.

03. යෝජිත නව ක්‍රමවේදය අනුව, සියළුම පළාත් සභා වල පළාත් ප්‍රධාන ලේකම්වරු ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් බවට පත්වීම මත මූලධන වියදම් පාලනය / අධීක්ෂණය අදාල රේඛීය අමාත්‍යාංශ ලේකම්ගෙන් බැහැර වන බැවින් සියළුම පළාත් සභා අතර සාධාරණ හා සමානාත්මතාවයෙන් යුතු මූල්‍ය විනයක් ඇති කිරීම සඳහා මුදල් කොමිසම විසින් ලබා දෙන උපදෙස් අනුව සියළුම පළාත් සභා කටයුතු කළ යුතුය.

04. අත්මුදල් නිදහස් කිරීම හා ඒ සම්බන්ධ අනුශාංගික කරුණු සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් වරින්වර නිකුත් කරනු ලබන සියළු උපදෙස් / චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතු වේ.

05. ඉහත සඳහන් සියළුම ආකෘති පත්‍ර මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ වෙබ් අඩවියේ (***www.treasury.gov.lk***) පළ කර ඇති අතර, මේ සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් අධ්‍යක්ෂ, ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ ( දු.ක. 011-2 484738 ) ඇමතීමෙන් ලබා ගත හැක.

06. වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් ලබා දෙන ප්‍රතිපාදනයන්ට අදාළව මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම, පළාත් සභා ගිණුම් පොත් සමඟ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතින් නිකුත් කරනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

අ/කලේ- ඒ.කේ.සෙනවිරත්න
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්

**එච්.සී.ඩී.එල්.සිල්වා**
අධ්‍යක්ෂ ජනරාල්


*භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*
*දුරකථන අංකය : 011-2484738 ෆැක්ස් අංකය : 011-2431498*
*විද්‍යුත් තැපැල : dgto@tod.treasury.gov.lk*


**පිටපත් -**

| | | |
|---|---|---|
| I. | ලේකම් , රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස |
| II. | ලේකම්, මුදල් කොමිෂන් සභාව | - කරු. දැ.ගැ.ස |
| III. | විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය | - කරු. දැ.ගැ.ස |
| IV. | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.ස |
| V. | අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.ස |
| VI. | අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.ස |